ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

අංක 07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல. 7, கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ෆැක්ස් / தொலைநகல் / Fax: 2684051
ඊමේල් / மின்னஞ்சல் / E-mail: Landcom@sltnet.lk

මගේ අංකය / எனது இல / MY NO: 5/2/රැස්වීම්/2005.
ඔබේ අංකය / உமது இல / YOUR NO:
දිනය / திகதி / DATE: 2005.06 2005.06.29

සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන් වෙත,

**<u>අතිගරු ජනාධිපති තුමා/තුමිය දීමනාපත්‍රයට අත්සන් තැබීමට පෙර ඉඩම්ලාභියා මියගොස් ඇතිවිට එවැනි දීමනාපත්‍ර අවලංගු කිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධව 2005.05.13 වන දින මෙම දෙපාර්තමේන්තුවේදී පවත්වන ලද පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ගේ රැස්වීම් වාර්තාවේ 8 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

මේ සම්බන්ධව ජනාධිපති ලේකම් කාර්යාලයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ පසු ලබාදුන් අනුමැතිය අනුව ඉහත සඳහන් දීමනා පත්‍ර සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි කටයුතු කිරීමට කරුණාකර පියවර ගන්න.

(I) ජනාධිපතිවරයා දීමනා පත්‍රය අත්සන් කර ඇතත්, ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ලියා පදිංචි කර නොමැති දීමනා පත්‍ර .

මෙම දීමනාපත්‍ර අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ දීමනා පත්‍රයේ මුල් පිටපත හා අනු පිටපත් සහිතව ඉඩම් ලාභියාගේ මරණ සහතිකයත්, එම මියගිය පුද්ගලයාත්, දීමනාපත්‍ර ලාභියාත් එකම අයෙකු බවට ප්‍රාදේශීය ලේකම් විසින් කරනු ලබන සහතිකයක් ඔබ වෙත ගෙන්වා ගෙන අවලංගු කිරීමේ අනුමැතිය ලබා දීමට කටයුතු කරන්න.

(II) දීමනා පත්‍ර ජනාධිපතිවරයා විසින් අත්සන් කොට ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ලියා පදිංචි කර ඇති දීමනා පත්‍ර

මේ සම්බන්ධයෙන්ද ඉහත (I) පරිදි අදාළ වාර්තාවන් ලබා ගැනීමෙන් පසු ඔබගේ තීරණය ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඉන්පසු ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ ලියා පදිංචියද අවලංගු කරවීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දෙන්න.

මෙසේ අවලංගු කරනු ලබන දීමනා පත්‍ර මුල් පිටපත් හා අනු පිටපත් අවලංගු කළ බවට සටහනක් හා යොමු අංක ඔබ විසින්ම සඳහන් කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොනු කර තබා ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දන්වා මුල් පිටපත හා අනුපිටපත් යවන්න. මෙසේ අවලංගු කළ දීමනාපත්‍ර පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යාම සුදුසු බව ද කරුණාවෙන් දන්වමි.

ඉහත අවස්ථා 02 ක යටතේම බලරහිත දීමනා පත්‍රයක් අවලංගු කිරීමෙන් පසු එම ඉඩම සම්බන්ධයෙන් බල පවත්වනු ලබන්නේ එකී ඉඩම සඳහා මුලින් ලබා දී තිබූ බලපත්‍රයයි. එම පදනම යටතේ කරුණාකර ඉදිරි කටයුතු කරන්න.

එස්.ජේ.පතිරණ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත:- සියළුම නියෝජ්‍ය /සහකාර ඉඩම් කොමසාරිස්වරුන් වෙත.

කාර්යාලය 2677166 | පරිපාලන 2677172 | ගිණුම් 2675674 | ඉඩම් 2675576 | සංවර්ධන [illegible]